සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 81 | S | I |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 10 - 2018

විභාග අංකය .................................... **කෘෂි හා ආහාර තාක්ෂණය I** කාලය පැය තුනයි

**මෙම පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත වන අතර අදාල පිළිතුරු අතරින් වඩාත් ගැලපෙන හෝ නිවැරදි පිළිතුර තෝරන්න.**
**සෑම ප්‍රශ්නයකටම ලකුණු එක බැගින් ලකුණු 40ක් හිමිවේ.**

1. කලා ඔය හරස්කොට කලා වැව නිර්මාණය කළ අතර මල්වතුඔය හරස්කොට නිර්මාණය කර ඇත්තේ,
   (1) බසවක්කුලම වැව යි. (2) ගිරිතලේ වැව යි.
   (3) හුරුළු වැව යි. (4) තිසා වැව යි.

2. වැවකින් ජලය බෙදාහැරීමේ දී ඇතිවන පීඩනය පාලනයට නිර්මාණය වූ සුවිශේෂී නිර්මාණය වූයේ,
   (1) රලපනාව ය. (2) පිටවාන ය.
   (3) බිසෝකොටුව ය. (4) සොරොව්ව ය.

3. රටේ ආර්ථික සංවර්ධනයේ දී කෘෂිකර්මාන්තය හා සම්බන්ධ කරුණක් නොවන්නේ,
   (1) විදේශ රැකියා සඳහා යොමුකරවීම ය. (2) භූමි පරිභෝජනය වැඩිකිරීම ය.
   (3) ආහාර සුරක්ෂිත භාවයට උපකාරී වීමය. (4) දළ දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමය.

4. තලවාකැලේ නගරයෙහි ඇති කෘෂිකාර්මික වැදගත්කම නම්,
   (1) බීජ අර්තාපල් පර්යේෂණාගාරය පිහිටීම ය. (2) රබර් පර්යේෂණාගාරය පිහිටීම ය.
   (3) තේ පර්යේෂණාගාරය පිහිටීම ය. (4) වී පර්යේෂණාගාරය පිහිටීම ය.

5. රන්දෙනිගල, කොත්මලේ, මාදුරු ඔය හා රන්ටැඹේ ජලාශ අයත්වන්නේ,
   (1) උඩවලව යෝජනා ක්‍රමයට යි. (2) මහවැලි යෝජනා ක්‍රමයට යි.
   (3) ගල්ඔය යෝජනා ක්‍රමයට යි. (4) සමනළ වැව යෝජනා ක්‍රමයට යි.

6. ශ්‍රී ලාංකාවට නිදහස ලැබීමෙන් පසු ආරම්භ කරන ලද ප්‍රථම බහු කාර්ය යෝජනා ක්‍රමය වූයේ ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමයයි. මෙම සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඉදිකරන ලද ජලාශය වන්නේ,
   (1) උඩවලව ජලාශය යි. (2) සේනානායක සමුද්‍රය යි.
   (3) ලුණුගම්වෙහෙර ජලාශය යි. (4) චන්ද්‍රිකා වැව යි.

7. විදේශිකයන් ගේ ආක්‍රමණයෙන් ශ්‍රී ලංකාවේ කුරුඳු වගාව ආරම්භ කරන ලද ප්‍රදේශ වන්නේ,
   (1) කොළඹ, කදිරාන, ඇවරිය වත්ත ය. (2) බොරැල්ල, කොළඹ, ගම්පහ ය.
   (3) හිඟුරාන, පිළියන්දල, ගම්පහ ය. (4) කොළඹ, ගම්පොල, කුරුණෑගල ය.

8. අප ගන්නා ආහාර ශක්ති ජනක ආහාර, ශරීරය වර්ධනය වන ආහාර සහ ආරක්ෂක ආහාර ලෙස වර්ග කර දැක්විය හැකිය. පහත ආහාර කාණ්ඩ අතරින් ශක්ති ජනක ආහාර පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
   (1) අඹ, ගොටුකොල, වට්ටක්කා (2) මස්, කිරිපිටි, මාජරින්
   (3) බත්, බතල, පාන් (4) සෝයාමීට්, මෑ, බඩ ඉරිඟු

9. වාර්ෂික වර්ෂාපතනය අනුව ශ්‍රී ලංකාව ප්‍රධාන දේශගුණික කලාප 3කට වෙන්කර ඇත.
   එම කලාප තුන වන්නේ,
   (1) තෙත් කලාපය, වියලි කලාපය හා ශුෂ්ක කලාපය යි.
   (2) තෙත් කලාපය, අතර මැදි කලාපය සහ වියලි කලාපය යි.
   (3) තෙත් කලාපය, වියලි කලාපය හා අර්ධ ශුෂ්ක කලාපය යි.
   (4) උඩරට තෙත් කලාපය, මැදරට තෙත් කලපය හා පහතරට තෙත් කලාපයයි.

10. ශ්‍රී ලංකාව දේශගුණික කලාපවලට බෙදා දැක්වීමේ ප්‍රධානතම පදනම වන්නේ,
   (1) ආලෝක තීව්‍රතාව යි. (2) උෂ්ණත්වය යි.
   (3) ආර්ද්‍රතාවය යි. (4) වාර්ෂික වර්ෂාපතනය යි.

11. ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පොලොන්නරුව යන දිස්ත්‍රික්ක වලට වැඩිම වර්ෂාපතනයක් ලැබෙන්නේ,
   (1) ඊසාන දිග මෝසම් වර්ෂාව මගින් ය. (2) සංවහන වර්ෂාව මගින් ය.
   (3) නිරිත දිග මෝසම් වර්ෂාව මගින් ය. (4) වාසුලි වර්ෂාව මගින් ය.

* ශ්‍රී ලංකාවේ එක්තරා නගරයක වර්ෂාපතන දක්වෙන දළ ප්‍රස්තාර සටහනක් රූපයෙන් දක්වේ. මේ අනුව 12,13,14 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




12. බීජ සිටුවීම සඳහා වඩාත් යෝග්‍ය මාස වන්නේ,
   (1) AB ය. (2) CD ය. (3) BE ය. (4) EF ය.

13. ධාන්‍ය බෝගයක අස්වැන්න නෙළීමට වඩාත් යෝග්‍ය මාස නම්,
   (1) AB ය. (2) CD ය. (3) AD ය. (4) BD ය.

14. ඉහත වර්ෂාපතන ප්‍රස්ථාරයට අදාල නගරය වන්නේ,
   (1) ගාල්ල (2) රත්නපුර (3) හැටන් (4) අනුරාධපුර

15. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට දායක වන අංශ පිළිවෙලින්,
   (1) කෘෂිකර්මය, කාර්මික හා සේවා ය. (2) සේවා, කාර්මික හා කෘෂිකර්මය ය.
   (3) කාර්මික, සේවා හා කෘෂිකර්මය ය. (4) කාර්මික, කෘෂිකර්මය හා සේවා ය.

16. ශ්‍රී ලංකාවේ භූ විෂමතාව, පස්වර්ගය හා භූමි භාවිතය මත කෘෂි දේශගුණික කලාප වලට බෙදා ඇත. ඒ අනුව මුළු කෘෂි පාරිසරික කලාප ගණන වනුයේ,
   (1) 46 කි. (2) 26 කි. (3) 56 කි. (4) 36කි.

17. වර්ෂාපතනය මැනීමේ සම්මත ඒකකය වන්නේ,
   (1) මිලි ලීටර් ය. (2) ඝන මීටර් ය. (3) ලීටර් ය. (4) මිලි මීටර් ය.

18. වාසුලි වර්ෂාවක් ලක්ෂණ වන්නේ,
   (1) වායු පීඩන අවපාත තත්වයක් ඇතිවී තද සුළං සහිතව නොකඩවා දින කිහිපයක් වැසි පැවතීම යි.
   (2) දිවා කාලයේ උනුසුම වැඩිවී සවස් කාලයේ ගිගුරුම් සහිත වැසි ඇතිවීම යි.
   (3) නිරිත දිශාවේ සිට සුළං හමා උදෑසනට වැසි ඇතිවීම යි.
   (4) ඊසාන දිශාවේ සිට සුළං හමා සවසට ගිගුරුම් සහිත තද වැසි ඇතිවීම යි.

19. පොල්, මිරිස්, කව්පි යන බෝග අයත් වන්නේ,
   (1) කෙටි දින ශාක කාණ්ඩයට යි. (2) උදාසීන ශාක කාණ්ඩයටයි.
   (3) ප්‍රභා අවධිශාක කාණ්ඩයටයි. (4) දිගු දින ශාක කාණ්ඩයට යි.

20. ශ්‍රී ලාකාවේ දිගම දිවා කාලය ඇති දිනය වන්නේ,
   (1) දෙසැම්බර් 21 ය. (2) ජූනි 21 ය. (3) ජූලි 21 ය. (4) අගෝස්තු 21 ය.

21. යල කන්නයේ වගා කළ බෝග වල අස්වනු නෙලන්නේ,
   (1) පෙබරවාරි මාසයේ ය. (2) දෙසැම්බර් මාසයේ ය.
   (3) මැයි මාසයේ ය. (4) අගොස්තු මාසයේ ය.

22. මුහුදු මට්ටමේ සිට ඉහළට යන සෑම මීටර් 100 කට ම උෂ්ණත්වය අඩු වන්නේ,
   (1) සෙල්සියස් අංශක 0.64 කින් ය. (2) සෙල්සියස් අංශක 0.74 කින් ය.
   (3) සෙල්සියස් අංශක 0.53 කින් ය. (4) සෙල්සියස් අංශක 64 කින් ය.

23. ශාක වල ප්‍රභාසංස්ලේෂණයට වැඩි වශයෙන් බලපාන ආලෝකයේ වර්ණ වන්නේ,
   (1) කහ සහ කොළ ආලෝකය යි. (2) නිල් සහ රතු ආලෝකය යි.
   (3) දම් සහ නිල් ආලෝකය යි. (4) රතු සහ කහ ආලෝකය යි.

24. පහත A හා B ක්‍රියාවලි නිවැරදිව දක්වා ඇත්තේ කුමන පිළිතුරෙහි ද?




   (1) A පාෂාණ ජීර්ණය B පාංශු ජනනය. (2) A රසායනික ජීර්ණය B භෞතික ජීර්ණය.
   (3) A භෞතික ජීර්ණය B රසායනික ජීර්ණය. (4) A පාංශු ජනනය B පාෂාණ ජීර්ණය.

25. පාංශු කලිල දෙවර්ගය වන්නේ,
   (1) මැටි කලිල හා රොන්මඩ යි. (2) වැලි හා කාබනික කලිල යි.
   (3) වැලි හා හියුමස් කලිල යි. (4) මැටි හා කාබනික කලිල ය.

26. රෝල් ක්‍රමයෙන් පසෙහි වයනය නිර්ණය කිරීමේදී පස් රෝල මුදුවක් ලෙස සැකසිය හැකිනම් එම පස
   (1) වැලි පසකි. (2) වැලි ලෝම පසකි. (3) මැටි ලෝම පසකි. (4) මැටි පසකි.

27. වනාන්තර බද ප්‍රදේශයන් හි පවතින කාබනික බහුල පසෙහි දක්නට ලැබෙන පාංශු ව්‍යුහය වන්නේ,
(1) තනි කණිකා ව්‍යුහය යි. (2) කැටිති ව්‍යුහය යි.
(3) කෝණාකාර ව්‍යුහය යි. (4) ස්ථම්භ ව්‍යුහය යි.

28. ආග්නේ ය පාෂාණයක ට උදාහරණයක් වන්නේ,
(1) ග්‍රැනයිට් ය. (2) ක්වෝට්ස් ය. (3) නයිස් ය. (4) වැලිගල් ය.

29. බෝග වගාවේදී සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩිවීමෙන්,
(1) දඬු කැබලි මුල් ඇදීම සාර්ථකව සිදු නොවේ.
(2) උෂ්ණත්වය අඩුවන නිසා ශාක කායික ක්‍රියා වේගවත් වේ.
(3) උත්ස්වේදනය අඩුවන නිසා ජලය හා පෝෂක අවශෝෂණය අඩු වේ.
(4) දිලීර රෝග ව්‍යාප්තිය අඩු වේ.

30. වාර්ෂික වර්ෂාපතනය 1750 - 2500 mm අතර ලැබෙන ප්‍රදේශ හඳුන්වනු ලබන්නේ,
(1) වියළි කලාපය ලෙස ය. (2) තෙත් කලාපය ලෙස ය.
(3) ශුෂ්ක කලාපය ලෙස ය. (4) අතරමැදි කලාපය ලෙස ය.

31. දේශගුණික කලාප මුහුදු මට්ටමේ සිට පිහිටා ඇති උච්චත්වය අනුව බෙදීමේ දී මැදරට උප කලාපයට අයත්වන උස වන්නේ,
(1) 300- 900 m අතර (2) 900 m වැඩි
(3) 300 m ට අඩු (4) 200 m ට අඩු

32. ගිනි කඳු පිපිරීම නිසා ඇතිවන මැග්මා සිසිලනය වීමෙන් සෑදෙන පාෂාණ වර්ගය වන්නේ,
(1) විපරිත පාෂාණ ය. (2) ආග්නේය පාෂාණ ය.
(3) අවසාදිත පාෂාණ ය. (4) මේ කිසිවක් නොවේ.

33. හුණුගල් හා ඩොලමයිට් විපරිතනයට භාජනය වීමෙන් සෑදෙන පාෂාණ වර්ගය,
(1) කිරි ගරුඬ පාෂාණ ය. (2) නයිස් පාෂාණ ය.
(3) ග්‍රැනයිට් පාෂාණ ය. (4) තිරුවානා පාෂාණ ය.

34. ගෙවත්තක වැට අයින සඳහා සුදුසු බෝග කාණ්ඩය
(1) එළවලු බෝග වේ. (2) පළා බෝග වේ.
(3) කුළු බඩු බෝග වේ. (4) ද්‍රවමය බෝග වේ.

35. පෘතුගීසීන් හා ලන්දේසීන් විසින් ලංකාවට හඳුන්වා දුන් බෝග කාණ්ඩය ඇතුලත් පිළිතුර වන්නේ,
(1) අන්නාසි, පැපොල්, රඹුටන් ය. (2) අන්නාසි, අඹ, දොඩම් ය.
(3) දූරියන්, මැංගුස්, අඹ ය. (4) කජු, මිදි, දොඩම් ය.

36. පසේ ලවනතාවය ඉවත් කරගැනීමට ගතහැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) ජලයෙන් සෝදා හැරීම යි. (2) ජලය පුරවා පස තුළට කාන්දු කරවීම යි.
(3) කාබනික පොහොර යෙදීම යි. (4) පසට හුණු යෙදීම යි.

37. අතීතයේ කෘෂිකර්මය මගින් පෝෂණය වූ ශික්ෂණයක් හා විනයකින් යුතු සංස්කෘතියක් පැවති බවට සාක්ෂියක් වන්නේ,
(1) නවීන යන්ත්‍රෝපකරණ බිහිවීම යි.
(2) කෘෂිකර්මය හා සම්බන්ධ ජන කවි බිහිවීම යි.
(3) වාරි තාක්ෂණයේ විශිෂ්ඨ නිර්මාණයන් පැවතීම යි.
(4) යැපුම් කෘෂිකර්මාන්තයේ නියැලීම යි.

38. වායව පරිසරය ප්‍රයෝජනයට ගන්නා වගා ක්‍රමයක් වන්නේ,
(1) වගා කුළුණු ය. (2) උස්පාත්ති ය.
(3) ගිල්වූ පාත්ති ය. (4) බඳුන්වල වගාවන් ය.

39.පාංශු වාතය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - පාංශු ජීවීන් ගේ මෙන්ම ශාක මුල් වල ස්වසනයට පාංශු වාතය වැදගත් වේ.
B - පාංශු වාතයේ $CO_2$ ප්‍රතිශතය වායුගෝලයට සාපේක්ෂව වැඩිය.
C - පස පෙරළීමෙන් පාංශු වාතය ඉවත් වී යයි.

(1) AහාC ය. (2) B හා C ය. (3) A හා B ය. (4) A, B, හා C ය.

40. ලෝක ජලදිනය යෙදී ඇත්තේ,
(1) මාර්තු 22 ය. (2) මැයි 22 ය. (3) පෙබරවාරි 20 ය. (4) මාර්තු 20.

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

81 S II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 10 - 2018

විභාග අංකය ....................................

## කෘෂි හා ආහාර තාක්ෂණය II

**උපදෙස් ෘ**
**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**
**පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හා අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහාම ලකුණු 10 ක් බැගින් ද හිමිවේ.**

01. බෝග වගාවේ දී උපරිම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා දේශගුණික සහ පාංශු සාධක පිළිබඳ මනා අවබෝධයෙන් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.
   - I. කාලගුණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
   - II. කාලගුණික පරාමිතීන් දෙකක් සඳහන් කරන්න.
   - III. ආලෝක තීව්‍රතාවය මැනගැනීමට භාවිතා කරන උපකරණය හා එහි ඒකකය සඳහන් කරන්න.
   - IV. බෝග වගාවට සුළඟ මගින් ඇතිවන හිතකර බලපෑම් දෙකක් ලියන්න.
   - V. පරිසර උෂ්ණත්වය වෙනස්වීමට බලපාන හේතු සාධක දෙකක් ලියන්න.
   - VI. තෙත් කලාපයට ලැබෙන වාර්ෂික වර්ෂාපතන ප්‍රමාණය දක්වන්න.
   - VII. කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයේ වැදගත් නම් දෙකක් සඳහන් කරන්න.
   - VIII. ක්ෂේත්‍ර ධාරිතා අවස්ථාවේ දී පසේ පවතින ජල ආකාර දෙක සඳහන් කරන්න.
   - IX. කාබනික පොහොර, වගාවන් සඳහා යොදා ගැනීමෙන් ලැබෙන වාසි දෙකක් දක්වන්න.
   - X. රතු දුඹුරු පස බහුලව පවතින ප්‍රදේශ දෙකක් දක්වන්න.

02. අතීතයේ පැවති කෘෂිකාර්මික ජීවන රටාව විදේශ ආක්‍රමණත් සමග බොහෝ වෙනස්වීමට බඳුන් විය.
   - i. a - විදේශ ආක්‍රමණ සමග කෘෂිකර්මයේ සිදුවූ වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
     b - බහුකාර්ය යෝජනා ක්‍රමයන්හි අරමුණු දෙකක් ලියන්න.
   - ii. හරිත විප්ලවය සමඟ ඇතිවූ ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.
   - iii. ආහාර සුරක්ෂිතතාවය සඳහා බලපාන ප්‍රධාන සාධක තුනක් දක්වා ඉන් එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න.

03. කෘෂිකරමයේදී පස පරිහරණය පිළිබඳව අවබෝධයෙන් කටයුතු කිරීමෙන් වඩාත් සාර්ථක ප්‍රතිඵල අත්කරගත හැකිය.
   - i. a - පාංශු ව්‍යුහය හඳුන්වන්න.
     b - පාංශු ව්‍යුහ ආකාර තුනක් දක්වන්න.
   - ii. පාංශු ව්‍යුහයේ වැදගත්කම් දෙකක් ලියන්න.
   - iii. මැටි අධික පසක් බෝග වගාවට නුසුදුසු වීමට හේතු දෙකක් දක්වන්න.

04. පහත දැක්වෙන්නේ පස් සාම්පලයක් බීකරයකට දමා ජලය එක්කර කලතා නිසලව තැබූවිට දිස්වන ආකාරයයි




   - i. A - F දක්වා ඇති කොටස් නම් කරන්න.
   - ii. ඉහත පරීක්ෂයට අනුව පසෙහි කුමන භෞතික ලක්ෂණයක් නිගමනය කර තිබේ
   - iii a - පසක වැලි වැඩිවීම බෝග වගාවට අහිතකර ලෙස බලපාන ආකාර දෙකක් ලියන්න.
     b- අධික වැලිපසක් වගාවට හිතකර තත්වයට පත්කරගත හැකි ක්‍රියා දෙකක් ලියන්න.
     c- ගංග දෙපස බහුලව දක්නට ලැබෙන පස් කාණ්ඩය නම් කරන්න.

05. පාංශු ජීවීන් බෝග වගාවට හිතකර මෙන්ම අහිතකර තත්වයන් ද ඇතිකරයි.

i. a- පාංශු ජීවීන් ප්‍රධාන කාණ්ඩ දෙක නම් කරන්න

b- බෝග වගාවෙදී පාංශු ජීවීන්ගෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න

ii. පාංශු ජීවී ගහණය ප්‍රසස්ත මට්ටමකින් පවත්වාගෙන යාමට අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග දෙකක් ලියන්න

iii. a - පස තුළ ජීවත්වන සහජීවී බැක්ටීරියාවක් නම් කරන්න

b - පස සාරවත් කරන මහා ජීවීන් දෙදෙනෙකු නම් කරන්න

06. පස පිළිබඳව හැදෑරීමේදී දර්ශීය පාංශු පැතිකඩක් අධ්‍යයනය කිරීම වැදගත්වේ කලාප පෙන්නුම් කරන පසේ සිරස්කඩක් පහත දැක්වේ.




i. A,B,C,R කලාප නම් කරන්න

ii. A කලාපයේ දැකිය හැකි විශේෂ ලක්‍ෂණ දෙකක් සඳහන් කරන්න.

iii. a - B කලාපයේ විශෙෂ ලක්‍ෂණය කුමක් ද?

b - A, B, C කලාපවල මුළු උස කුමන නමකින් හැඳින්වේද?

07. අවිධිමත් ලෙස පස පරිහරණය හේතු කොටගෙන පසේ ගුණාංග පිරිහීම පාංශු හායනය ලෙස හඳුන්වයි

i. පස තදවීමට බලපාන හේතු දෙකක් දක්වන්න

ii. a - පස ආම්ලික වීමට හේතු දෙකක් සඳහන් කරන්න

b- ආම්ලිකතාවය ඉවත් කිරීමට යොදාගත හැකි ද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න

iii. a- පාංශු ඛාදන කාරක දෙකක් සඳහන් කරන්න

b - පාංශු ඛාදනය වළක්වා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් ලියා දක්වන්න

පළමු වාර පරීක්ෂණය - 2018
කෘෂි හා ආහාර තාක්ෂණය - 10 ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය

## I - කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | 11 | 1 | 21 | 4 | 31 | 1 |
| 2 | 3 | 12 | 3 | 22 | 1 | 32 | 2 |
| 3 | 1 | 13 | 3 | 23 | 2 | 33 | 1 |
| 4 | 3 | 14 | 4 | 24 | 1 | 34 | 4 |
| 5 | 2 | 15 | 2 | 25 | 4 | 35 | 1 |
| 6 | 2 | 16 | 1 | 26 | 4 | 36 | 2 |
| 7 | 1 | 17 | 4 | 27 | 2 | 37 | 3 |
| 8 | 3 | 18 | 1 | 28 | 1 | 38 | 1 |
| 9 | 2 | 19 | 2 | 29 | 3 | 39 | 3 |
| 10 | 4 | 20 | 2 | 30 | 4 | 40 | 1 |

## II - කොටස

01.

i. යම් ප්‍රදේශයක කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවතින ස්වභාවය - (ලකුණු 2)

ii. වර්ෂාපතනය , උෂ්ණත්වය, වායු පීඩනය , සුළගේ වේගය හා දිශාව, වාතයේ අඩංගු ජල වාෂ්ප ප්‍රමාණය හා සූර්ය විකිරණයේ ස්වභාවය. (ලකුණු 2)

iii. සූර්ය විකිරණමාන ලක්ස් (Lux) (ලකුණු 2)

iv. මඳ සුළඟින් ශාක පත්‍ර අවට වාතය මිශ්‍ර වන බැවින් ප්‍රභාසංස්ලේෂණ වේගය වැඩිවී අස්වැන්න වැඩි වේ.

මඳ සුළඟ බෝගවල පරාගණය සඳහා දායක වේ. උත්ස්වේදන වේගය වැඩ වීමෙන් ජලය හා ශාක පෝෂක අවශෝෂණය වැඩි වේ. (කරුණු 2කට ලකුණු 02)

v. සමකයේ සිට ඇති දුර, උච්චත්වය, මුහුදේ සිට ඇති දුර ප්‍රමාණය වන ගහනය, අභ්‍යන්තර ජලාශ පිහිටා තිබීම මිනිස් ක්‍රියාකාරකම් (කරුණු 2කට ලකුණු 02)

vi. 2500 mm වැඩි (ලකුණු 02)

vii. සමාකාර දේශගුණික තත්ත්ව ඇති ප්‍රදේශ හඳුනාගත හැකිවීම.
යල හා මහ කන්නවල කාල සීමා අනුව වගා කටයුතු සැලසුම් කළ හැකිවීම.
ඒ ඒ කලාපයට සුදුසු බෝග නිර්දේශ කළ හැකිවීම.
කෘෂිකාර්මික ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට පහසු වීම.
කෘෂිකාර්මික ඉඩම් කලාපීය කරණයට උපකාරී වීම.
ඉඩම් සංවර්ධන හා සංරක්ෂණ කටයුතු පහසු වීම (ලකුණු 02)

viii. කේශාකර්ෂණ ජලය
ජලාකර්ෂණ ජලය (ලකුණු 02)

ix. පසේ භෞතික ලක්ෂණ යහපත් වේ (පාංශු වාතය, වයනය, ජලය, ව්‍යුහය) ආදී පිළිතුරු (ලකුණු 02)

x. වියළි කලාපයට අයත් ප්‍රදේශ ( ලකුණු 02)

02. i. a - වැවිලි බෝග හඳුන්වාදීම, පෘතුගීසින් සහ ලන්දේසීන් ඔවුන් විසින් පරිභෝජනයට ගත් විවිධ බෝග වර්ග ලංකාවට හඳුන්වාදීම, ආදී පිළිතුරකට (ලකුණු 2)

b - කෘෂි නිෂ්පාදනය ඉහළ දැමීම, ඉඩම් නැති අයට ඉඩම් ලබාදීම , ජල විදුලිය නිපදවීම,
වියළි කලාපයේ ජන ශුන්‍ය ප්‍රදේශ වල ජනාවාස ඇති කර තෙත් කලාපීය අධික
ජනගහනය පාලනය කිරීම, රැකියා සැපයීම, පහළ නිම්නවල ජල ගැලීම් පාලනය කිරීම
වන වගාව ව්‍යාප්ත කිරීම හා පරිසරය ආරක්ෂාකිරීම ආදී පිළිතුරකට (ලකුණු 2 )

ii. කෙටි කාලයක් තුළ වැඩි අස්වනු ලබා දෙන බීජ වර්ග හඳුන්වා දීම
කෘෂි රසායන ද්‍රව්‍ය හඳුන්වා දීම සහ ඒවායේ භාවිතය වැඩිවීම
ගොවිපොළ යාන්ත්‍රීකරණය වැඩිවීම
මෙතෙක් වගා කළ එක් කන්නය වෙනුවට කන්න දෙකක් වගා කිරීම
ලෝක ධාන්‍ය නිෂ්පාදන ආසන්න වශයෙන් දෙගුණයකින පමණ වැඩි වීම.
අතිරික්ත නිශ්පාදන අළෙවි කිරීමට ප්‍රමුඛතාවය ලබා දීම ආදී පිළිතුරකට (ලකුණු 2)

iii. ආහාර සුලභතාව , ප්‍රවේශ වීමේ හැකියාව, ප්‍රයෝජනයට ගැනීම - සාධක තුනට (ලකුණු 02 )
විස්තර කිරීමට (ලකුණු 1)

03. i. a - ස්වභාවික තත්ත්ව යටතේ පස් අංශු එකට එකතු වී සෑදී ඇති පස් සමූහනවල රූපකාරය හෙවත් ස්වරූපයයි. (ලකුණු 03)
b - තනි කණිකා, ස්ථම්භික, අණු කෝණාකාර හා කැටිති (ලකුණු 03)

ii. සිටුවීමට සුදුසු බෝග තෝරාගැනීමට, ජල සම්පාදන කාලාන්තර තීරණය කිරීම ආදී කරුණු 2කට (ලකුණු 02)

iii. ජල වහනය දුර්වල වීම, පාංශු අවකාශ අඩුවීම, ශාක මුල් හා ක්ෂුද්‍ර ජීවී ශ්වසනයට බාධා පමුණුවයි. සී සෑම ආදී කටයුතු අපහසු වේ. ආදී පිළිතුරකට (ලකුණු 02)

04. i. A- ගල්බොරළු, B - රළු වැලි, C - සියුම්වැලි, D - රොන්මඩ, E - මැටි අවලම්භිත ජලය F - කොළ රොඩු (ලකුණු 3)

ii. පාංශු සංඝටක (ලකුණු 02)

iii. a - බෝග ඇදවැටීම, ජලය රඳවාගැනීමේ හැකියාව අඩුය ආදී පිළිතුරකට (ලකුණු 2)
b - කාබනික ද්‍රව්‍ය එකතු කිරීම, මැටි එකතු කිරීම ආදී පිළිතුරකට (ලකුණු 02)
c - දියළු පස් (ලකුණු 1)

05. i. a- මහා ජීවින්, ක්ෂුද්‍ර ජීවීන් (ලකුණු 2)
b - පස බුරුල් කිරීම ආදී පිළිතුරු දෙකකට (ලකුණු 2)

ii. පසට කාබනික ද්‍රව්‍ය එක් කිරීම ආදී පිළිතරු දෙකකට (ලකුණු 2)

iii. a- රයිසෝබියම් (ලකුණු 02)
b- වේයා, ගැඩවිලන් (ලකුණු 2)

06. i. A- උඩු පස/ විශෝධන කලාපය
B - යටි පස / සංචායය කලාපය
C - මාතෘ ද්‍රව්‍ය
R - මාතෘ පාෂාණය (ලකුණු 4)

ii. අදාළ පිළිතුරට ලකුණු දෙන්න. (ලකුණු 2)

iii. a - ඉහලින් සෝදාගෙන ආ ද්‍රව්‍ය තැන්පත් වීම (ලකුණු 2)
b- පාංශු ගැඹුර (ලකුණු 2)

07. එකම ගැඹරට සී සෑම , මැටි අධික වීම ආදී පිළිතුරට ලකුණු දෙන්න. (ලකුණු 2)

i. a - රසායනික පොහොර බහුලව භාවිතා කිරීම භාෂ්මික කොටස් සේදීයාම ආදී පිළිතුරට ලකුණු දෙන්න. (ලකුණු 2 )

ii. b - හුණු ගල්, ජිප්සම් ආදී පිළිතුරට ලකුණු දෙන්න ( ලකුණු 2)

iii. a -ජලය සුළඟ ආදී පිළිතුරට ලකුණු දෙන්න (ලකුණු 2)
b - ගල්වැටි දැමීම, සෝල්ට් කාණු කැපීම ආදී පිළිතුරට ලකුණු දෙන්න (ලකුණු 2)